**ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 27 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (ආ) | රු.173,300 ක් වටිනා වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ වර්ෂයේ එකතු කිරීම් යටතේ දක්වා නොතිබීම. | 1.6.1 (ආ)(ii) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) පුනරාවර්තන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | භාණ්ඩාගාර මුද්‍රිත SA 10 අනුව වැටුප් වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ රු.21,423,491 ක් වුව ද, රු.21,642,644ක් ලෙස රු.219,153 ක් වැඩියෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි හා ACA – 2 (ii) ආකෘතියෙහි දක්වා තිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සකස් කිරීමේ දී අතපසුවීමකින් දේශීය ගමන් වියදම් රු.219,153 ක් වැටුප් වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභවලට එක්කර ඇති බව දන්වා තිබුණි. | වියදම් නිවැරදිව වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය. |
| (ii) | භාණ්ඩාගාර මුද්‍රිත SA 10 අනුව අනෙකුත් භාණ්ඩ හා සේවා වටිනාකම රු.15,456,221 ක් වුව ද, රු.15,237,069 ක් ලෙස රු.219,152 ක් අඩුවෙන් ACA – 2 (ii) ආකෘතියෙහි හා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සකස් කිරීමේ දී අතපසුවීමකින් දේශීය ගමන් වියදම් රු.219,153 ක් වැටුප් වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභවලට එක්කර ඇති බව දන්වා තිබුණි. | වියදම් නිවැරදිව වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | භාණ්ඩාගාර මුද්‍රිත SA 82 අනුව 2021 දෙසැම්බර් 31 දිනට කාර්යාල උපකරණ ශේෂය රු.517,818 ක් වුව ද, 2022 ජනවාරි 01 දිනට එය රු.677,581 ක් ලෙස රු.159,763 ක් වැඩියෙන් ඉදිරියට ගෙනවිත් තිබුණි. එමෙන්ම පරිගණක උපකරණ හා ලී බඩු පිළිවෙලින් රු.138,000 ක් හා රු.21,763 ක් අඩුවෙන් ඉදිරියට ගෙනවිත් තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතුව පැවති කාර්යාල උපකරණ, පරිගණක උපකරණ හා ලී බඩුවල පිරිවැය වටිනාකම වැරදිමකින් රු.677,581, රු.3,534,788, රු.5,060,899 ක් ලෙස සටහන් වී ඇති බව දන්වා තිබුණි. | ආරම්භක ශේෂයන් නිවැරදිව වාර්තා කළ යුතුය. |
| (ii) | ඉකුත් වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.173,300 ක් වූ මූල්‍ය නොවන වත්කම් සමාලෝචිත වර්ෂයේදී ද ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ භාණ්ඩ ස්ථාවර වත්කම් යටතට අයත් නොවන බැවින් ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා (1201) හා වෙනත් (1409) යටතේ ගිණුම්ගත කර ඇති බව දන්වා තිබුණි. | වත්කම් අත්පත් කරගැනීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රකාශ අනුව රු.967,042 ක බැරකම් වාර්තා නොවුව ද, ගිණුම් සටහන (iv) හි බැරකම් පිළිබඳ ප්‍රකාශයේ රු.967,042 ක බැරකම් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සටහන් (IV) හි දැක්වෙන රු.967,042 ක බැරකම් 2022 ගිණුම් වර්ෂය අවසන් වූ පසුව 2023 වර්ෂයේදී, 2022 වර්ෂයට අදාළව ලද බිල්පත් බැවින් එම වටිනාකම් මහා භාණ්ඩාගාරය වෙත සටහන් කිරීමේ හැකියාවක් නොමැත. (cigas හරහා) කෙසේ නමුත් විගණන විමසුමේ දැක්වෙන පරිදි ඉදිරියේ දී එවැනි බිල්පත් සඳහා ඇස්තමේන්තුගත අගයයන් සහිතව භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | බැරකම් පිළිබඳ විස්තර නිවැරදිව භාණ්ඩාගාරයට වාර්තා කළ යුතු ය. |

## 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර ඉන් අනතුරුව එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කලට සමාලෝචනය කිරිමට ඉදිරියේ දී කටයුතු කරන බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරිම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතායට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.2 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ 2020 හා 2021 සඳහා වූ වාර්ෂික කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවට 2022.04.19 දින ඉදිරිපත්කර ඇත. 2022 සඳහා වූ වාර්ෂික කාර්ය සාධන වාර්තා සකසමින් පවතින අතර නියමිත දිනට පෙර ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | ව්‍යවස්ථාපිත විධිවිධාන | | | | |
| (i) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 අතිවිශේෂ ගැසට් නිවේදනය | | අවස්ථා 27 කදී රු.25,000 ට වැඩි එකතුව රු.2,008,371 ක් වූ ගෙවීම් වෙනුවෙන් පනත ප්‍රකාරව මුද්දර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 ජනවාරි 01 දිනට මෙම දෙපාර්තමේන්තුව මුද්දර බදු සඳහා ලියාපදිංචි වී ඇත. ඒ අනුව දැනට නිසි පරිදි රු.25,000 ට වැඩි ගෙවීම් සඳහා මුද්දර බදු අයකර ගැනීම සිදු කරනු ලබන බව දන්වා තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | ණය සහන දායක මණ්ඩල ආඥා පනතේ 2 හා 3(2) ඡේද | | ණය සහනදායක මණ්ඩලයේ සාමාජික මණ්ඩල සභාපති හා සාමාජිකයින් 04 දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර , එහි සන පූර්ණය සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු වුව ද, සන පූර්ණය සම්පූර්ණ නොවී තිබියදී නඩු විසඳීමේ කටයුතු සිදුකර තිබුණි. | අදාළ දිනයන්හි ණය සහනදායක මණ්ඩලයේ ප්‍රධාන මණ්ඩලයේ සභාපති ඇතුළු සාමාජිකයින් 04 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, එම දිනයන් හිදී විමසීම සඳහා සාමාජිකයින් දෙදෙනෙකු පමණක් සහභාගී වී තිබුණු අතර දෙපාර්ශවයන් වෙත කැඳවීම් ලිපි යවා තිබුණු බැවින්ද, ඔවුන් විසින් මුදල් ගෙවා නීතිඥවරුන් ගෙන්වා ගෙන තිබුණු බැවින්ද, එදින රැස්වීම් වාරය පවත්වා ඉදිරි දින නියමකර තිබුණි. ඉල්ලුම්පත් විමසීමක් හෝ බේරුම්කිරීමක් එහිදී සිදු නොවී තිබුණු බව දන්වා තිබුණි. | 1941 අංක 39 දරන ණය සහනදායක මණ්ඩල ආඥා පනතේ 2 හා 3(2) ඡේද ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371 (5) | 200,000 | අවස්ථා දෙකකදී ලබා දී තිබුණු රු.200,000 ක් වූ තත්කාර්යය අතුරු අග්‍රිම පියවීමේ දී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | මේ වනවිට තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ඒකී අග්‍රිම පියවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දැක්මේ සඳහන් පරිදි නිශ්චල දේපල සම්බන්ධයෙන් වූ ණය ගනුදෙනුවලින් පීඩාවට පත් වූ මහජනයාට ණය බරින් නිදහස් වීමට සහනදායී වැඩපිළිවෙලක් සලසාදීමට ප්‍රමාණවත් ක්‍රියාකාරකම් හඳුනාගෙන නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දී ණයගැති භාවයෙන් පෙළෙන ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 05 ක් පමණක් ජනවාරි මාසයේ දී උතුරු පළාත ඉලක්ක කරගෙන සිදුකර තිබුණු අතර, වෙනත් කිසිඳු ප්‍රදේශයක ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඇතුළත් පොස්ටර අධිකරණ අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් ගාල්ල, කුරුණෑගල හා ගම්පහ ශාඛා මණ්ඩලවලට අයත් දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බෙදාහැරීම සිදුකර ඇත. ඒ අනුව අදාළ දැනුවත් කිරීම් නිසි පරිදි සිදු කරමින් පවතී. 2023.03.23 දින අධිකරණ අමාත්‍යාංශයේ මාධ්‍ය සාකච්ඡාවක් දෙපාර්තමේන්තුව පිළිබඳ හැඳින්වීමක් කරන ලද අතර එය මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවල පළකර ඇති බව දන්වා තිබුණි. | ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණට අනුගතව ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට වගබලා ගත යුතු වේ. |

## 3.2 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තා මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ගතවීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, 2020 හා 2021 වර්ෂයන්ට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2023 අප්‍රේල් 19 වන දින ය. | 2020 හා 2021 වාර්ෂික කාර්ය සාධනය වාර්තා 2023.04.19 දින පාර්ලිමේන්තු සභා ගතකර ඇති බව දන්වා තිබුණි. | නියමිත දිනට වාර්ෂික කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු ය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ගිණුම් සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වාර්ෂික කාර්ය සාධන වාර්තාව කඩිනමින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කටයුතු කරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛවලට අනුගත වෙමින් වාර්ෂික ගිණුම් සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතු ය. |

## 3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට හා අධිකරණ අමාත්‍යාංශයේ 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 දරන චක්‍රලේඛය අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 04 දෙනෙකු ඇප තබා නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන්ගේ ඇප තැබීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 880 හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වීම. |

## 3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 ජනවාරි 11 දින සිදු වූ මෝටර් රථ අනතුරට අදාළව මුදල් රෙගුලාසි 104 (3) යටතේ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත්කර තිබුණේ 2023 පෙබරවාරි 21 දින වන අතර මුදල් රෙගුලාසි 104 (4) යටතේ අලාභයන් පිළිබඳව අවසාන වාර්තාව 2023 මාර්තු 10 දින ඉදිරිපත් කර තිබුණි. එමෙන්ම මෝටර් රථය සඳහා වූ රු.101,800 ක් වූ අලාභය මූල්‍ය ප්‍රකාශයෙහි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | 2022 දෙසැම්බර් 15 වන දින පොලිස් වාර්තාව ලැබීමෙන් පසු 2023 පෙබරවාරි මස එම පරීක්ෂණය අවසන් කර ඇති බවත්, 2022 වර්ෂය තුළදී මු.රෙ. 104 පරීක්ෂණය අවසන් කිරීමට නොහැකි වූ නිසා එම අනතුර පිළිබඳ හානි පාඩු ලේඛනයේ ඇතුළත් කර නොමැති බවත් දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 104 (3) හා (4) අනුව කටයුතු කළ යුතු වීම හා අලාභ හානි මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු වීම. |
| (ආ) | වාහන අලුත්වැඩියාවන් සඳහා රජයේ කාර්මික නිලධාරියෙකුගේ නිර්දේශය ලබාගෙන නොතිබුණි. | මින් ඉදිරියට රජයේ කාර්මික නිලධාරින්ගේ නිර්දේශය ලබාගැනිමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වාහන අලුත්වැඩියාවන්වල දී රජයේ කාර්මික නිලධාරියෙකුගේ නිර්දේශය ලබාගත යුතු වීම. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව 2022 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ආ නඩු සංඛ්‍යාවල වෙනස්කම් නිරීක්ෂණය විය. | 2023 පෙබරවාරි මස ප්‍රධාන ශාඛාවේ හා සියලු ශාඛාවල නඩු ගොනු අතින් ගණන් කරන ලදි. ඒ අනුව විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ආරම්භක නඩු සංඛ්‍යාව නිවැරදි බව දන්වා තිබුණි. | නිසිපරිදි වාර්තා පවත්වාගෙන යා යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) දෙපාර්තමේන්තු වාර්තාවලට අනුව 2022 දෙසැම්බර් 31 දිනට තිබිය යුතු නඩුගොනු ප්‍රමාණය හා භෞතිකව දෙපාර්තමේන්තුව සතු නඩුගොනු ප්‍රමාණය අතර වෙනසක් පැවති අතර ඒ අනුව ප්‍රධාන ශාඛාවේ නඩු ගොනු 836 ක හා ගම්පහ ශාඛාවේ නඩු ගොනු 03 ක ඌණතාවයක් ද, ගාල්ල ශාඛාවේ නඩු ගොනු 59 ක අතිරික්තයක් ද නිරීක්ෂණය විය. | ප්‍රධාන ශාඛාවේ පවතින 836 වෙනසට හේතු වන්නේ, කුරුණෑගල ශාඛාව 2022.01.18 දින හා කොළඹ ශාඛාව 2022.11.28 ආරම්භ කිරීම නිසා ප්‍රධාන ශාඛාවේ නඩුගොනු එම ශාඛා අතර බෙදී යාම හා 2023 පෙබරවාරි මස සියලු ශාඛා මණ්ඩලවල නඩුගොනු අතින් ගැන ගණන් බලනවිට නඩුගොනු ප්‍රමාණවල වෙනසක් හා ගාල්ල ශාඛාව හා ගම්පහ ශාඛාවන් හි පවතින වෙනසට හේතු වන්නේ, 2023 පෙබරවාරි මස සියලු ශාඛා මණ්ඩලවල නඩුගොනු අතින් ගණන් බලනවිට නඩුගොනු ප්‍රමාණවල වෙනසක් පැවතීම බව දන්වා තිබුණි. | නිසිපරිදි දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ජාතික මට්ටමේ උපාය මාර්ග කළමනාකරණ සැලැස්මට අනුව ආයතනිකව, පළාත් හා ජාතික මට්ටමින් ළඟාකර ගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු නම් කර තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයට යොමු කර තිබුණේ 2023 අප්‍රේල් 17 වන දින ය. | 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ජාතික මට්ටමේ උපාය මාර්ග කළමනාකරණ සැලැස්මට අනුව ආයතනිකව, පළාත් හා ජාතික මට්ටමින් ළඟාකරගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු නමකර තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයට 2023.04.17 දින යොමුකළ බව දන්වා තිබුණි. | නියමිත දිනට අදාළ පත්කිරීම් සිදුකිරීමට වගබලා ගත යුතු ය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කාර්ය මණ්ඩලය තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 01 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 01 ක් පැවති අතර ද්විතියික මට්ටම තුළ 05 ක අතිරික්තයක් පැවතුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටම තුළ ගණකාධිකාරි තනතුර පුරප්පාඩු වී ඇති අතර, ද්විතියික මට්ටම තුළ සංවර්ධන නිලධාරී තනතුරු 14 ක අතිරික්තයක් ද ප්‍රාථමික මට්ටම තුළ රියදුරු තනතුරක් ද පුරප්ඩු වී ඇති බව දන්වා තිබුණි. | සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා |

| | | | |
|---|---|---|---|
| | | | දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමටත් කටයුතු කළ යුතු ය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 13.3 ඡේදය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් සිදුකල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස වුව ද, 2021 මාර්තු 17 දින සිට පුරප්පාඩුව පවතින ගණකාධිකාරී තනතුරට 2023 මාර්තු 22 දින වන විටත් නිත්‍ය පත්වීමක් සිදුකර නොතිබුණි**.** | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1506/IV සහ 2021.03.17 දිනැති ලිපියෙන් ගණකාධිකාරී තනතුරක් අනුමත කර තිබුණ ද 2021 වර්ෂයෙන් පසු මේ දක්වා ගණකාධිකාරී සේවයේ තනතුර සඳහා බඳවා ගැනීමක් සිදුකර නොමැති බැවින් මේ දක්වා නිත්‍ය තනතුරට නිලධාරියෙකු පත්කර ගැනීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ යුතුය. |